# ගසක් සිටුවා සතුටක් ලැබූ මම



කතාව හා චිත්‍ර : ශෙනුකි අමාෂා කුමාරසිංහ

# ගසක් සිටුවා සතුටක් ලැබූ මම

කතාව හා චිත්‍ර : ශෙනුකි අමාෂා කුමාරසිංහ

| | | |
|---|---|---|
| කෘතියේ නම | :- | ගසක් සිටුවා සතුටක් ලැබූ මම |
| කථාව හා චිත්‍ර | :- | එම්.පී. ශෙනුකි අමාෂා කුමාරසිංහ |
| වෙනත් කෘති | :- | අසරණ චූටි පූසා |
| | | කුරුළු කූඩුව |
| ප්‍රථම මුද්‍රණය | :- | 2026/05/10 |
| පාසල | :- | මහාමායා බාලිකා විදුහල |
| ඉගෙනුම ලබන පංතිය | :- | 4 ශ්‍රේණිය |

ISBN අංකය - 978-624-211-273-2

# පිදුම

මාගේ ආදරණීය

මහාමායා මෑණියන්ට

මේ පොත

ආදරයෙන් පුදමි.

# ස්තූතිය

මෙම පොත නිර්මාණය කිරීමට හා
අඩුපාඩු කියා දුන්
මාගේ මවට හා පියාට පළමුව
ස්තූති කරමි.

විෂයාන්තර කටයුතු වලදී මෙන්ම
විෂය බාහිර කටයුතු වලදීත්
මුල් තැන ලබා දෙමින්
අර්ථවත් කිරීමට කැපවෙන
අප පාසල වන
මහ / මහාමායා බාලිකා විදුහල
හා
ගුරු මඩුල්ලට
මාගේ ගෞරවණීය ස්තූතිය
මින් පුද කරමි.

කතා : ශෙනුකි අමාෂා කුමාරසිංහ
ලිපිනය : 52/1, ධර්මරාජ මාවත, මහනුවර.
දුරකතනය අංකය : 077 - 8919114



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කල හැකිය.දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත් කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ඨ ජයග්‍රහණයකි.මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට වන අත්දැකිම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි.එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් ගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තුතිය පුද කරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,  
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.  
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.  
**2026-05-10**

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
**2026.05.10**

දවසක් දා මගේ
පාසලේ පරිසර කමිටුවේ ගුරුතුමිය
පැළයක් සිටුවන්න කිවුවා.



මම ගෙදර ගිහින් අම්මට කිවුවා
මට පැළයක් හදන්න ඕනේ කියලා,



අම්මා දින කිහිපයකට පස්සේ
මාව පැළ තවානකට
එක්කගෙන ගියා.



පැළ තවානේ
පැළ ගොඩක් තිබුනා.

මම පැළ දෙකක්ම
ගෙදර අරගෙන ආවා.



මම ගෙනාව පැළ වලින්
කටු අනෝදා
පැළය සිටවන්න සිතුවා.

මගේ අම්මා පැළය හදන්න
මට උදව් කරා.
මම පැළයට වතුරත් දැම්මා.



දින කිහිපයකට පස්සේ මම
අනෝදා පැළය බලන කොට
චූටි දළු දෙකක් ඇවිත් තිබුණා.

මට දැනුණු සතුට
දරා ගන්න බැරි වුණා.




දවසින් දවස අනෝදා පැළය
ටිකෙන් ටික ලොකු වෙලා
මට හරිම සතුටුයි.



ටික කාලයක් ගත වුණා,
කටු අනෝදා ගස ළඟට ගියාම
ගස දැන් මටත් වැඩිය උස වෙලා,



අම්මා කිවුවා තව ටික
කලක් යනකොට කටු අනෝදා
ගසේ ගෙඩිත් හැදෙයි කියලා,
මම දැන් සතුටින්
ගහ දිහා බලාගෙන ඉන්නේ
ගෙඩි හැදෙනකම්,



පුංචි මගේ හිතට කටු අනෝදා
පැලය දැන් දකින කොට
දැනෙන සතුට වචන වලින්
කියන්න බැරි තරම්,



## පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක ගත්කතුවරුන් දැයට දායාද කල මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනිමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි.ඩිජිටල් තාක්ෂණික යුගයෙ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමයා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙය, පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මිමමෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය,ගුරුභවතුන්,දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්න වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)